# පුරප්පාඩු

## ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී පාලි මණ්ඩපයෙහි පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් 2021 දෙසැම්බර් 28 වැනි දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.

## 01. තාක්ෂණික නිලධාරී (විදුලි) III ශ්‍රේණිය

සුදුසුකම් :
(i) අ.පො.ස. (උසස් පෙළ) විභාගය භෞතික විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම **සහ**
(ii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ විදුලි ඉංජිනේරු යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ National Vocational Qualification 5 වෙනි මට්ටමට නොඅඩු නිපුණතා සහතික පත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : U– MT1(III)
රු. 31,625 -7X300, 10X355 - 37,275/- (මාසික) සහ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා

බඳවා ගන්නා ක්‍රමය : ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

## 02. හෙද නිළධාරී II ශ්‍රේණිය

සුදුසුකම් :
1. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් තුනකට සම්මාන සහිතව විෂයන් හයකින් (06) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම **සහ**
2. ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලයේ හෙද සහතිකය ලබා තිබිය යුතුය.

වැටුප් පරිමාණය : U– MT1(III)
රු. 31,625 -7X300, 10X355 - 37,275/- (මාසික) සහ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා

බඳවා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මගින්

වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

## 03. පරිගණක වැඩසටහන් සම්පාදක

සුදුසුකම් :
1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම **සහ**
2. පරිගණක භාෂා එකක් හෝ ඊට වැඩි ගණනකින් පරිගණක වැඩසටහන් සම්පාදනය කිරීමේ හැකියාව

වැටුප් පරිමාණය : U-AS 1 (I)
රු: 48,385 - 19X690 - 61,495/= (මාසික) සහ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා

බඳවා ගන්නා ක්‍රමය : අභියෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 04. වැඩසටහන් සම්පාදක සහ පද්ධති විශ්ලේෂක II ශ්‍රේණිය

සුදුසුකම් :
(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු හෝ දෙවන පෙළ සම්මානයක් සහිතව විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම **හෝ**
(ii) (a) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම **සහ**
(b) පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම **හෝ**
(iii) (a) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමර්ථයක් සහිතව පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම **හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම (පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා නොමැති) **සහ**
(b) පරිගණක ස්ත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම **හෝ**
(iv) (a) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් (පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා නොමැති) ලබා තිබීම **සහ**
(b) පරිගණක ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්දක් ලබා තිබීම **හෝ**
(v) (a) වෙනත් ඕනෑම උපාධියක් **සහ**
(b) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම **සහ**
(c) පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම **හෝ**
(vi) පරිගණක වැඩසටහන් සම්පාදකයෙකු ලෙස විශ්වවිද්‍යාල සේවයේ වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : (U-AS 2 (II) රු. 50,625-3X1,335 - 54,630/= (EB) 55,965 - 14X1,335 - 74,655/= (මාසික) සහ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා

බඳවා ගන්නා ක්‍රමය : අභියෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 05. වෛද්‍ය නිලධාරී

සුදුසුකම් :
1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් වෛද්‍ය උපාධියක් ලබා තිබීම සහ අවම වශයෙන් වසර තුනක් (03) වෛද්‍යවරයෙකු ලෙස සේවය කර තිබීම.

වැටුප් පරිමාණය : U-MO1(II) රු. 55,350 -10X1,335; 1X1,630 - 70,330/- (මාසික) සහ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා

බඳවා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මගින්.

### කොන්දේසි හා ප්‍රතිලාභ

1. තෝරාගනු ලබන අයදුම්කරුවන් පත්වීම ලද දින සිට වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.
2. තෝරා පත් කර ගනු ලබන අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම්වලින් 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුපටද, 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලටද බැර කරනු ලැබේ.
3. තවද 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවක භාරකාර අරමුදලට බැරකරනු ලැබේ.
4. බඳවා ගැනීමට අදාළ අනෙකුත් කොන්දේසි 16/1978 දරන විශ්වවිද්‍යාල පනත හා එහි අනෙකුත් සංශෝධන, නියමාවලි නීති හා රෙගුලාසිවලට අනුකූල වේ,

### අයදුම්පත් එවිය යුතු ආකාරය

1. ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ට ශ්‍රී පාලි මණ්ඩපයේ වෙබ් අඩවියෙන් (https://spc.cmb.ac.lk) ආදර්ශ අයදුම්පතක් බාගත (download) කළ හැකිය.
2. සම්පූර්ණ කරන ලද අයදුම්පත, සත්‍ය පිටපත් බවට සහාථ කරන ලද අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්වලට අදාළ සහතික පිටපත් සමග **නියෝජ්‍ය ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ** යන ලිපිනයට 2021 දෙසැම්බර් 28 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.
3. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.
4. විශ්වවිද්‍යාල සේවයේ/ රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානියා මගින් එවනු ලබන අයදුම්පතෙහි පිටපතක් **නියෝජ්‍ය ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, වැවල, හොරණ** යන ලිපිනයට එවීමට කටයුතු කරන්න.
5. අසම්පූර්ණ, අපැහැදිලි, අදාළ සහාථ කිරීම් සිදු නොකළ, සහතිකවල පිටපත් අමුණා නොමැති හෝ ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් මත යළි සලකා බලනු නොලැබේ.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**ශ්‍රී පාලි මණ්ඩපය, වැවල, හොරණ.**
**ලේඛකාධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවට.**
2021.12.16